රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - **2019**

-----------------------------------------------------

**1.1** මතය

-------

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ("බැංකුව") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

-------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියාකර ඇති බව,

- බැංකුව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මුල්‍ය ප්‍රකාශනය

**1.5.1** නොසැසඳු පාලන ගිණුම් සහ වාර්තා

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ස්ලිප් පාලන ගිණුම **(Slip Control Acount)** තුළ රු. 2,022,797 ක නොසැසඳු බැර වටිනාකමක් හෙළිදරව් කර තිබුණි. | ස්ලිප් පාලන ගිණුම්වල දීර්ඝ කාලීනව සමථයකට පත් නොවූ ශේෂයන් ඉවත් කිරීමට අදාළ ශාඛා කළමනාකරුවන්ට උපදෙස් දෙන ලදී. | උක්ත වටිනාකම සැසඳීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට අනෙකුත් වගකීම් යටතේ පෙන්වා ඇති අවිනිශ්චිත ගිණුමේ රු. 2,895,111 ක ශේෂයක් හෙළිදරව් කර තිබුණි. | කුරුණෑගල ශාඛාවේ අවිනිශ්චිත ශේෂය හැර අනකුත් ශාඛාවන් අවිනිශ්චිත ශේෂය මේ වනවිට නිවැරදි කර ඇත. | බැංකුවේ සියලු අවිනිශ්චිත ශේෂ නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

**1.6** ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුල්‍ය ප්‍රකාශන වල වෙනත් ණයගැතියන් යටතේ රු. 2,400,000 ක වංචා ගිණුමක් වාර්තා වී තිබුණු අතර එම වටිනාකම 1999 වර්ෂයේදි සිදු වු වංචාවන් දෙකක් සම්බන්ධයෙන් වේ.කෙසේ නමුත් මෙම ශේෂයන් අයකර ගැනිම අවිනිශ්චිත සහගත වේ. | මෙම අගය 2020 වර්ෂයේදී පොත්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. | මෙම අගය කපා හැරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට අනෙකුත් වත්කම් යටතේ සටහන් කර තිබූ රු. 2,406,460 ක ගොඩනැගිලි කුලී 2020 ජුනි 22 දින වනවිටත් අයිතිකරුවන්ගෙන් අය කර ගෙන නොතිබුණි. | අදාල ගොඩනැගිලි හිමිකරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකරගැනීමට මූලික නීති ක්‍රියාමාර්ග ගෙන ඇත. | අදාල ගොඩනැගිලි හිමිකරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කල යුතුය. |

විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| ගම්පහ | රු.1,049,600 |
| මහනුවර | රු. **8**25,000 |
| හොරණ | රු. 531,860 |

| | | | |
|---|---|---|---|
| (iii) | 2019 දෙසැම්බර් 31 දිනට ජොෂ්ය පුරවැසියන්ගේ තැන්පතු සඳහා ලැබිය යුතු මුළු පොළිය රුපියල් 617,374,536 ක් විය. විස්තර පහත පරිදි වේ.<br>2017 රු.192,529,105<br>2018 රු.249,193,681<br>2019 රු.131,694,637<br>උපචිත පොළිය රු. 43,957,113<br>එකතුව රු.617,374,536 | 2017 වර්ෂය සඳහා ලැබිය යුතු පොළිය රු. 192,529,105 ක මුදල 2020 අගෝස්තු 29 දින මහා භාණ්ඩාගාරය විසින් ගෙවා තිබුණි. | ලැබියයුතු ජොෂ්ය පුරවැසි ගිණුම් සඳහා පොළිය ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කල යුතුය. |

**1.6.2.** අත්තිකාරම් ගිණුම

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අත්තිකාරම් ගිණුමේ 2019 දෙසැම්බර් 31 දින වන විට රුපියල් 1,563,966 ක් වූ හර ශේෂයක් තිබුණු අතර මෙම ශේෂය සැලකිය යුතු කාලයක සිට අයකරගෙන නොතිබුණි. | පහත සඳහන් දීර්ඝ කාලීන ශේෂයන් හැර සියලු අත්තිකාරම් අයකරගෙන ඇත.<br>ලෙජර් ගිණුම් අංක **2/22/4703**<br>2007 ට පෙර — රු.1,386,771 — මෙම ශේෂය අයකරගැනිමට තොරතුරු නොමැත.<br>2012 — රු.40,000 — දැනටමත් අදාල නිලධාරීන් දැනුවත්කර ඇත.<br>හඳුනා නොගත් හිලව්කිරීම්. — රු.(120,**187**)<br>ශේෂය — රු.1,306,584 | දීර්ඝකාලීන ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ii) | 2019 වර්ෂය සඳහා දළ අක්‍රීය ණය අත්තිකාරම්, පිළිවෙලින් සේවක අර්ථසාධක ණය සහිතව සියයට 21.21 ප්‍රතිශතයක් සහ, සේවක අර්ථසාධක ණය රහිතව සියයට 7.73 ප්‍රතිශතයකි.මෙහි කර්මාන්ත අනුපාතය පිළිවෙලින් සියයට **5.5** හා සියයට **3.9** ප්‍රතිශතයක් වන අතර බැංකුව එම අනුපාතිකය ඉක්මවා ගොස් තිබුණි. | ඉරු දින පාස්කු ප්‍රහාරය හේතුවෙන් දළ අක්‍රිය ණය අනුපාතය හා සේවක අර්ථසාධක ණය රහිතව අක්‍රිය ණය අනුපාතය 2019 වර්ෂයේදී මඳ වශයෙන් ඉහල ගොස් ඇත. | බැංකුවේ අක්‍රිය ණය අනුපාතය අඩු කර ගැනීමට අයකරගැනිමේ ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 03/2016. | බැංකුව විසින් සිය සේවකයින්ගේ වැටුපෙන් අඩු කිරීම වෙනුවට තමන්ගේම අරමුදල් වලින් 2019 වර්ෂය සඳහා රු.20,770,371 ක් උපයනවිට බදු ගෙවීම් (PAYE TAX ) ලෙස ගෙවා ඇත. | සාමූහික ගිවිසුමේ විධිවිධාන අනුව සේවකයින්ගේ උපයනවිට බදු (PAYE TAX ) ගෙවීම් බැංකුව විසින් දරනු ලැබේ. | බැංකුවේ උපයනවිට (PAYE) බදු ගෙවීම් සඳහා "2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 03/2016" පිළිපැදිය යුතුය. |
| (ii) | **2007** බැංකු පනතේ මාර්ගෝපදේශ අංක 12 3(2)(i) ඡේදයට අනුව පාලක මණ්ඩලය 7 කට වඩා අඩු හෝ 13 කට වඩා වැඩි නොවිය යුතුය | 2019 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය 06 දෙනෙකුගෙන් පමණක් සමන්විත වේ. | උකස් හා ආයෝජන බැංකු නීතියේ විධිවිධානවලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරන ලද සුදුසු පුද්ගලයින් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. උකස් හා ආයෝජන බැංකු නීතියේ ගණපූරණය සඳහා අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර මීට අමතරව අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව අඩු කිරීමට උකස් හා ආයෝජන බැංකු නීතියට අනුව හැකියාව නොමැත. | අවම අධ්‍යක්ෂවරුන්ගේ නියාමනයට අනුකූල විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය රු. **419,073,514** ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. **244,472,029** ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. **174,601,515** ක වර්ධනයක් දක්නට ලැබුණි. මෙම වර්ධනයට හේතු වී ඇත්තේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව පොලී ආදායම වැඩිවීම සහ ආදායම් බදු වියදම් රු. **154,680,405** කින් අඩුවීමයි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් ප්‍රවනතා විග්‍රහය

---

බැංකුවේ පොලී ආදායම රු. මිලියන **456** කින් හෝ සියයට **8.26** ක ප්‍රතිශතයකින් පෙර වර්ෂයට සාපේක්ෂව ඉහල ගොස් තිබුණි. බැංකුවේ ණය සහ අත්තිකාරම් රු. බිලියන **1.6** කින් හෝ සියයට **4.8** ක ප්‍රතිශතයකින් වැඩිවීම පොලී ආදායම වැඩිවීමට හේතුවී ඇත. බැංකුවේ පොලී වියදම රු. මිලියන **373** කින් හෝ සියයට **10** ක ප්‍රතිශතයකින් ඉහල ගොස් ඇති අතර එයට හේතු වන්නේ පාරිභෝගිකයන්ගේ තැන්පතු රු. බිලියන **4.5** කින් හෝ සියයට **13.4** ක ප්‍රතිශතයකින් පෙර වර්ෂයට සාපේක්ෂව ඉහල යාමයි. **2019** වර්ෂයේ වැටුප් වර්ධකය නිසා බැංකුවේ පුද්ගල වියදම රු. මිලියන **58** කින් හෝ සියයට **7** ක ප්‍රතිශතයකින් පෙර වර්ෂයට සාපේක්ෂව ඉහල ගොස් ඇත.

**2.3** ගිණුම්කරණ අනුපාත විග්‍රහය

---

බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශ අනුපාත හා සසඳන විට සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාතයන් පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| විස්තරය | ආංශික බලපත්‍රලාභී විශේෂිත බැංකු | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | | |
|---|---|---|---|---|
| | 2019 % | 2019 % | 2018 % | 2017 % |
| ලාභදායි අනුපාත | | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE)% | 6.8 | 7.73 | 4.82 | 3.62 |
| වත්කම් සාමාන්‍ය මත ප්‍රතිලාභය (ROA)% | 0.8 | 1.11 | 1.13 | 0.98 |
| ශුද්ධ පොලී ආන්තිකය% | 3.4 | 4.52 | 4.72 | 4.66 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත | | | | |
| ප්‍රාග්ධන අනුපාත - පෙළ 1 | 12.3 | 21.04 | 21.69 | 23.74 |
| මුළු ප්‍රාග්ධන අනුපාත | 15.6 | 21.77 | 22.23 | 24.29 |
| වත්කම්වල ගුණාත්මකභාවය | | | | |
| දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතය (සේවක අර්ථසාධක අරමුදල් ඇතුලත්ව) | 5.5 | 21.21 | 22 | 19.37 |
| දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතය (සේවක අර්ථසාධක අරමුදල් රහිතව) | 3.9 | 7.73 | 7.0 | 4.5 |
| ද්‍රවශීලතා අනුපාතය | | | | |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය(%) | 53.1 | 121.05 | 83.91 | 86.88 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(i). 2019 වර්ෂයේ ලාභය පෙර වර්ෂයට වඩා වැඩි වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE) සියයට 2.91 ක ප්‍රතිශතයකින් වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ii). 2019 වර්ෂයේ ශුද්ධ පොලී ආන්තිකය සියයට 4.52 ක ප්‍රතිශතයක් වූ අතර එය ආංශික බලපත්‍රලාභී විශේෂිත බැංකු ක්‍රේෂ්ත්‍රයේ ප්‍රතිශතයක් වූ සියයට **3.4** ට සාපේක්ෂව වැඩි වීමකි.

(iii). බලපත්‍රලාභී බැංකු ක්ෂේත්‍රයේ සේවක අර්ථසාධක අරමුදල් සහිතව දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතිතය සියයට **5.5** ක ප්‍රතිශතයක් වන අතර බැංකුවේ අක්‍රීය ණය අනුපාතිකයත් ඉතා ඉහළ අගයක් ගනී. එයට හේතුව වන්නේ සේවක අර්ථසාධක අරමුදල් ණය වර්ගය තුළ අක්‍රීය ණය ඉහළ අගයක් ගැනීම වේ. කෙසේ වෙතත් සේවක අර්ථසාධක අරමුදල් ණය ශ්‍රී ලංකා මහ බැංකුව මගින්

අයකර ගත හැකිය. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් රහිතව දළ අත්තිකාරම් අක්‍රීය ණය අනුපාතිකය සියයට 7.73 ක ප්‍රතිශතයක් වන අතර එය ක්ෂේත්‍රයේ අනුපාතිකය වූ 3.83ක ප්‍රතිශතයට වඩා ඉහළ අගයක් වේ.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** හඳුනාගත් අලාභ

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 සැප්තැම්බර් 01 සිට 2017 මාර්තු 31 දක්වා කාලය තුළ බැංකුවේ ණය අංශය විසින් ව්‍යාජ පෞද්ගලික සංවිධාන දෙකක සේවකයින් ලෙස පෙනී සිටි අයදුම්කරුවන් හතළිස් හතක් (47) සඳහා රුග මිලියන 68.34 ක ණය ලබා දී ඇත. ව්‍යාජ සංවිධාන දෙකෙහි සේවකයින් ලෙස පෙනී සිටින අයදුම්කරුවන් අදාළ ණය සඳහා අයදුම් කිරීමේදී ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව අනාවරණය විය. ඉහත ණය මුදලෙන් රුග **61,528,617** ක් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය ශේෂයට ද ඇතුළත් කර තිබුණි. | මෙහි සඳහන් ණය අදාළ වැරදිකරුවන්ගෙන් අය කර ගැනීම බැංකුව විසින් රහස් පොලිසියට පවරා ඇත. | එම මුදල අය කර ගැනීම සඳහා වැරදිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කල යුතුය. |

**3.2** මෙහෙයුම් අකාරක්ෂමතාවය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
| --- | --- | --- |
| **2019** වර්ෂය සඳහා දැනටමත් ගෙවා ඇති අතිරික්ත ගෙවීම් රුපියල් **12,450,865** ක මුදල සැලකිල්ලට නොගෙන **2020** ජුනි **30** වන දින මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්දේ අවසන් ගෙවීම ලෙස කළමනාකාරිත්වය රුපියල් **12,609,581** ක් ගෙවා ඇත. | අපගේ බදු උපදේශකගේ තාක්ෂණික උපදෙස් අනුව **2019/2020** කාල සීමාව සඳහා බැංකුව මූල්‍ය සේවා සඳහා අවසන් එකතු කළ අගය මත බද්ද ලෙස රුග **12,609,581** ක් ගෙවා ඇත. මෙම ගණනය කිරීම සඳහා ලාභාංශ ආදායම මත මූල්‍යමය නොවන එකතු කළ අගය මත බදු ආදායම, සාධාරණ වටිනාකම් සහ මූල්‍ය ආයතනය සමඟ ස්ථානගත කිරීමෙන් ලැබෙන ආයෝජන ආදායම ඇතුළත් වන අතර, ඉහත ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම **2019/2020** වසර සඳහා වන අවසන් එකතු කළ අගය මත බදු ප්‍රතිලාභයෙන් බැහැර කරන ලෙස ඔවුහු අපට උපදෙස් දී ඇත. ඉහත සඳහන් මූලාශ්‍ර මූල්‍ය එකතු | අවසාන ගෙවීම නිවැරදි තොරතුරු මත ගෙවීමට කටයුතු කරන්න. |

| | | |
|---|---|---|
| | කළ අගය මත බද්ද යටතේ සලකා බැලීමේ අභියෝගය නිසා අභියාචනාධිකරණ නඩුව තවමත් නඩු ගොනුවේ ක්‍රියාත්මක වෙමින් පවතී. පැමිණිලිකරුට පක්ෂව තීන්දුවක් ලබා දෙන්නේ නම්, එවැනි ප්‍රතිලාභයක් ඉල්ලා සිටිය හැකි වුවද, පැමිණිලිකරුට එරෙහිව තීන්දුව ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත්, ඉහත ආදායම් මාර්ග මත මූල්‍ය එකතු කළ අගය මත බදු නොගෙවීම සම්බන්ධයෙන් බැංකුවට කිසිදු දඩයක් (penalty) ගෙවීමට නොලැබේ. | |

**3.3** ප්‍රසම්පාදන කළමණාකරනය

------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් | නිර්දේශය |
|---|---|---|
| මූලික බැංකු විසඳුම (core banking solution) මිලදී ගැනීමේ ක්‍රියාවලිය 2016 ජුනි මාසයේ ආරම්භ වුවද, විගණන දිනය දක්වා මූලික බැංකු විසඳුම (core banking solution) මිලදී ගැනීමට බැංකුවට නොහැකි විය. තවමත් එම ක්‍රියාවලිය ආරම්භක අවධියේ පවතී. | බැංකුව 2020 ජූලි17 වන දින ලංසු කැඳවූ අතර ඒ සඳහා ලංසු 5 ක යෝජනා ලැබී තිබුණි. ඊට පසු තාක්ෂණික අගය කිරීමේ කමිටුව අගය කිරීම් (අදියර 1) ආරම්භ කල අතර එය සම්පූර්ණ කර තාක්ෂණික ඇගයීම කමිටු වාර්තාව 2020 දෙසැම්බර් 02 වන දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත භාර දෙන ලදි. මෙම වාර්තාව, මූල්‍ය ඇගයීමත් සමඟ මූල්‍ය හා දණ්ඩාංග යෝජනා ඉදිරියට ගෙනයාම සඳහා තාක්ෂණික ඇගයීමේ අදියර සම්පූර්ණ වීමෙන් පසු අනුමැතිය ලබා ගැනීම සඳහා එම ක්‍රියාවලියේ ප්‍රගතිය වාර්තා කිරීමට අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) ට යවන ලද අන්තර් වාර්තාවකි.<br>අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) අනුමැතිය ලබාගැනීමෙන් පසු, මූල්‍ය ලංසු විවෘත කිරීමට සැලසුම් කිරීම සහ මූල්‍ය අගය කිරීමේ අවසාන අදියර අඛන්ඩව සිදුකෙරේ. | හැකි ඉක්මනින් බැංකුවේ මූලික බැංකු විසඳුම මිලදී ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4** මානව සම්පත් කළමනාකරණය

**විගණන නිරීක්ෂණ**

බැංකුවේ නියමිත කාර්ය මණ්ඩල තත්වයට අනුව අනුමත කාර්ය මණ්ඩලය **467** වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය **372** වේ.එහි ප්‍රතිඵලයක් ලෙස **2020** ජුලි **31** දිනට **95** ක සේවක පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි. බැංකුවේ සුමට ක්‍රියාකාරිත්වයට බලපාන්නාවු ප්‍රධාන කළමනාකරණ තනතුරු වල පුරප්පාඩු **2019** දෙසැම්බර් **31** දිනට පැවති බව තවදුරටත් අනාවරණය විය.

| විස්තරය | පුරප්පාඩු සංඛ්‍යාව | තනතුර පුරප්පාඩු වී ඇත්තේ කවදා සිටද යන්න |
|---|---|---|
| නියෝජ්‍ය. සාමාන්‍යධිකාරී.(ණය අංශය) | 1 | 5/10/19 |
| නියෝජ්‍ය. සාමාන්‍යධිකාරී ( මූල්‍ය හා සැලසුම්) | 1 | 23/4/16 |
| නියෝජ්‍ය සාමාන්‍යධිකාරී ( මානව සම්පත් වැඩි දියුණු කිරීම හා කළමනාකරණය) | 1 | 13/3/12 |
| සහකාර සාමාන්‍යධිකාරී ( අවදානම් කළමනාකරණය) | 1 | 2/5/17 |
| සහකාර සාමාන්‍යධිකාරී ( ණය පරිපාලනය) | 1 | 1/3/17 |
| සහකාර සාමාන්‍යධිකාරී (තක්සේරු) | 1 | 5/9/19 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 14/8/14 |

**කළමනාකරණ අදහස්**

<u>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය අංශය)</u>

එල්.අයි.රණසිංහ මහතා මෙම තනතුර සඳහා **2020** ඔක්තෝබර් **26** වන දින බඳවාගන්නා ලදි.

<u>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සැලසුම්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා කළමනාකරණ)</u>

**2020** මැයි **21** වන දින පුරප්පාඩු වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සැලසුම්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා කළමනාකරණ) සඳහා තේරීපත් වූ අයදුම්කරු ඇයගේ පෞද්ගලික හේතුවක් මත ඉදිරිපත් වූ අර්පණය ප්‍රතික්ෂේප කරන ලද අතර කිසිදු අයදුම්කරුවෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන හා කළමනාකරණ) සඳහා තේරීපත් නොවිණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා සැලසුම්) සඳහා නැවත **2020** ඔක්තෝම්බර් **18** වන දින අයදුම්පත් කැඳවූ අතර සම්මුඛ සාකච්ඡා **2020** දෙසැම්බර් **14** වන දින පවතවන ලදි.

<u>සහකාර සාමාන්‍යාධිකාරී (අවධානම් කළමනාකරණ)</u>

මෙම පුරප්පාඩුව සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ සාකච්ඡා පවත්වා බඳවාගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වෙමින් පවතී.

<u>සහකාර සාමාන්‍යාධිකාරී (ණය</u>

**නිර්දේශය**

බැංකුවේ කටයුතු සුමටව සිදු වන බව සහතික කිරීමට අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගැනිමට කටයුතු කල යුතුය.

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කළමනාකරු (තොරතුරු තාක්ෂණ) | 1 | 2/9/11 | |
| ප්‍රධාන කළමනාකරු (අයකර ගැනීම්) | 1 | 20/9/17 | |
| ප්‍රධාන කළමනාකරු (ණය) | 1 | 1/1/14 | |

පරිපාලන)

බැංකුවේ දැනට පවතින මෙහෙයුම් අවශ්‍යතාවය මත මෙම තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය සඳහා යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත මෙම බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

<u>සහකාර සාමාන්‍යධිකාරී (තක්සේරු)</u>

2020 අප්‍රේල් 30 දින අයි. එදිරිසූරිය මහතා සහකාර සාමාන්‍යාධිකාරී (තක්සේරු) සඳහා උසස්කරන ලදි. බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතාවය මත මෙම තනතුර ඉදිරියේදී පිරවීමට නියමිතය.

<u>ප්‍රධාන අභ්‍යන්තර විගණක</u>

2020 දෙසැම්බර් 04 වන දින එන්.ඒ.ආර්.නිරෝෂිණී ද සිල්වා මහත්මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස බඳවා ගන්නා ලදි.

<u>ප්‍රධාන කළමනාකරු (තොරතුරු තාක්ෂණ)</u>

මෙම පුරප්පාඩුව බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතාවය මත පිරවීමට නියමිතය. දැනට උපදේශකවරයෙකු (consultant) යටතේ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදය (structure) පවතින අතර මෙම බඳවා ගැනීම ඒ අනුව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

<u>ප්‍රධාන කළමනාකරු (අයකිරීම්)</u>

මෙම පුරප්පාඩුව බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතාවය මත පිරවීමට නියමිතය.

<u>ප්‍රධාන කළමනාකරු(ණය)</u>

මෙම පුරප්පාඩුව බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතාවය මත පිරවීමට නියමිතය.